# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2424/60 - 2025 පෙබරවාරි මස 20 වැනි බ්‍රහස්පතින්දා - 2025.02.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (xvi) (ඩී)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වැනි වගන්තිය සමග කියවිය යුතු 18 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2025 පෙබරවාරි මස 20 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2025 අංක 02 දරන අසාත්මිකතාවේද සහ ප්‍රතිශක්තිවේද ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, 2025.02.18 දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

2. මේ නියමාවලිය, පනතේ 24අ (1) වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදන ලද්දා වූ ද, 2025 අංක 2424/58 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද්දා වූ ද නියමය මගින් පිහිටුවන ලද (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ අසාත්මිකතාවේද සහ ප්‍රතිශක්තිවේද ආයතනයට අදාළ විය යුතු ය.

3. මේ ආයතනය (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට අනුබද්ධ වන්නේ ය.

1A - PG 7035 — 54 (2025/02)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## I වන කොටස

### ආයතනයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය

4. මේ නියමාවලියේ විධිවිධානවලට සහ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයට පහත සඳහන් බලතල, කාර්යය සහ කර්තව්‍ය තිබිය යුතු යඃ-

(අ) ශ්‍රී ලංකාව තුළ ආසාත්මික, ප්‍රතිශක්තිවේදී සහ බෝවන රෝග වඩාත් හොඳින් අවබෝධ කර ගැනීම, එකී රෝග සඳහා ප්‍රතිකාර කිරීම සහ අවසාන වශයෙන් එකී රෝග වළක්වා ගැනීම සඳහා අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ, අණුක වෛද්‍ය විද්‍යාවේ සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවේ විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් මූලික සහ ව්‍යවහාරික විද්‍යාත්මක පර්යේෂණ ආරම්භ කිරීම, ඒ සඳහා පහසුකම් සැලසීම සහ එකී පර්යේෂණ සිදු කිරීම සහ ශක්තිමත් කිරීම;

(ආ) ආයතනයට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීම;

(ඇ) ආයතනයේ නිර්දේශ මත සහ විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, ආයතනයේ ශිෂ්‍යයන්ට උපදේශන අධ්‍යාපනය ලබා දීම සහ අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ, අණුක වෛද්‍ය විද්‍යාවේ සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පුහුණු කිරීම් සහ පර්යේෂණ සිදු කිරීම;

(ඈ) පාලක සභාවේ අනුමතය ඇතිව, අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ, අණුක වෛද්‍ය විද්‍යාවේ සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ප්‍රවීණතාව ලබාගෙන ඇති තැනැත්තන් නිශ්චය කර ගැනීමේ කාර්යය සඳහා විභාග පැවැත්වීම;

(ඉ) පාලක සභාවේ අනුමතය ඇතිව සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ, අණුක වෛද්‍ය විද්‍යාවේ සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් ඉහත සඳහන් අනුමත අධ්‍යයන පාඨමාලා හදාරා ඇත්තා වූ ද, ආයතනයේ විභාග සමත්ව ඇත්තා වූ ද සුදුසුකම්ලත් ශිෂ්‍යයන්ට ප්‍රදානය කළ යුතු ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි අභිඥානපත්‍ර, උසස් අභිඥානපත්‍ර, පශ්චාත් උපාධි සහතික සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම;

(ඊ) ආයතනය විමසා, විශ්වවිද්‍යාලය විසින් අතුරු ව්‍යවස්ථා මගින් නියම කරනු ලබන විභාග සමත්ව සහ වෙනත් යම් කොන්දේසි සපුරා -

(i) ප්‍රථම උපාධි;

(ii) පශ්චාත් උපාධි අභිඥානපත්‍ර;

(iii) උසස් අභිඥානපත්‍ර;

(iv) පශ්චාත් උපාධි සහතික;

(v) දර්ශනපති උපාධි (එම්ෆිල්);

(vi) අධ්‍යයන ක්‍රියාකාරකම් පර්යේෂණ සංරචකයක් ඇතුළත් ශාස්ත්‍රපති උපාධි;

(vii) ආචාර්ය උපාධි (පීඑච්ඩී);

(viii) මණ්ඩලයේ සහතිකය සහිත, ආසාත්මිකතාවේදය සහ සායනික ප්‍රතිශක්තිවේදය පිළිබඳ වෛද්‍ය විශාරද උපාධි (එම්ඩී); සහ

(ix) විශ්වවිද්‍යාලයේ වෙනත් යම් උචිත ශාස්ත්‍රීය විශිෂ්ටතා,

ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලබා ඇති ශිෂ්‍යයන් පාලක සභාව වෙත නිර්දේශ කිරීම;

(උ) ආයතනයේ බලතල, කාර්යය සහ කර්තව්‍යවලට සමාන බලතල, කාර්යය සහ කර්තව්‍ය ඇති, ශ්‍රී ලංකාවේ හෝ විදේශීය වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන සමග ආචාර්යවරුන්, ශාස්ත්‍රීධරයන් සහ ශිෂ්‍යයන් හුවමාරු කර ගැනීමෙන් හෝ අන්‍යාකාරයකින් සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඌ) උසස් අධ්‍යාපන ආයතනවලට, උසස් අධ්‍යාපන විද්‍යායතනවලට හෝ වෙනත් යම් උපාධි ප්‍රදාන ආයතනවලට ඇතුළත් වීමට අපේක්ෂා කරන තැන්තන් විසින් හෝ ඒවායේ ශිෂ්‍යයන් විසින් සමත් විභාග, ලබාගෙන ඇති සුදුසුකම් සහ ගත කළ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාලසීමාව හෝ හැදෑරූ අධ්‍යයන විෂය, අතුරු ව්‍යවස්ථා මගින් පිළිගනු ලැබිය හැකි, ආයතනයේ යම් විභාගවලට සහ ඉගෙනීමේ හෝ අධ්‍යයන කාලසීමාවට හෝ ඉන් යම් කොටසකට සමාන බවට පිළිගැනීම සහ ඕනෑම අවස්ථාවක දී එම පිළිගැනීම ඉවත් කර ගැනීම;

(එ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුර, මහාචාර්ය ධුර, ආශ්‍රිත මහාචාර්ය ධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුර, කථිකාචාර්ය ධුර හෝ පරිපාලන තනතුරුද ඇතුළු වෙනත් යම් තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ තාවකාලිකව අත්හිටුවීම සම්බන්ධයෙන් පාලක සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ඒ) ආයතනයේ ඉගැන්වීමේ, පුහුණු කිරීමේ හෝ පර්යේෂණ කාර්යය සඳහා අවශ්‍ය පුස්තකාල, රසායනාගාර, පර්යේෂණ මධ්‍යස්ථාන, කියවීම් කාමර, විනෝදාස්වාද මධ්‍යස්ථාන, කාර්යය මණ්ඩලය සහ ශිෂ්‍යයන් සඳහා වන ආපනශාලා සහ වෙනත් යම් සුබසාධන පහසුකම් සහ වෙනත් යම් ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ සැපයීම සහ ඒවා නඩත්තු කිරීම;

(ඔ) පාලක සභාවේ අනුමතය ඇතිව, විදේශීය ශාස්ත්‍රඥයන් සහ වෘත්තිකයන් ද ඇතුළුව ආයතනය විසින් අනුමත කරනු ලැබිය හැකි යම් තැනැත්තන් ආචාර්යවරුන්, පරීක්ෂකවරුන්, පුහුණුකරුවන්, උපදේශකවරුන් සහ පර්යේෂණ අධීක්ෂකවරුන් ලෙස ආයතනයට පත් කිරීම සහ එකී තැනැත්තන්ගේ සේවා නියම සහ කොන්දේසි සහ ඔවුන්ගේ වැටුප්, දීමනා, පාරිශ්‍රමික හෝ වෙනත් සමාන ප්‍රතිලාභ නිශ්චය කිරීම;

(ඕ) ශාස්ත්‍රීය සහ වෘත්තීය වටිනාකමක් සහ වැදගතමක් ඇති නිර්දේශිත අධ්‍යයන වාර සඟරා, ග්‍රන්ථ, වාර සඟරා සහ වෙනත් යම් ප්‍රකාශන මුද්‍රණය කිරීම සහ පළකිරීම සහ ඒවාට දායක වීම සඳහා ලේඛකයන් පෙළඹවීම සහ ඔවුන්ට අනුග්‍රහය දැක්වීම;

(ක) ආයතනයේ ශිෂ්‍යයන්ගේ ශාස්ත්‍රීය සහ වෘත්තීය සංවර්ධන කාර්යය සඳහා සම්මන්ත්‍රණ, සමුළු සහ නේවාසික වැඩමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම;

(ග) පාලක සභාව විමසා, ආයතනයේ සුදුසුකම්ලත් ශිෂ්‍යයන්ට අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ආධාර මුදල්, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීම;

(ච) තත්කාර්යය සඳහා විධිවිධාන සලස්වා ඇති යම් අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව විශ්වවිද්‍යාලයෙන් පිටත ස්ථානවල පර්යේෂණ සහ පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් පැවැත්වීම සඳහා වැඩපිළිවෙල යෙදීම;

(ජ) තත්කාර්ය සඳහා විධිවිධාන සලස්වා ඇති, ආයතනයට අදාළ අතුරු ව්‍යවස්ථාවලට, රජයේ මුදල් රෙගුලාසිවලට හෝ රජයේ ප්‍රතිපත්තිවලට අනුකූලව ගාස්තු නිශ්චය කිරීම, ඉල්ලා සිටීම සහ භාරගැනීම;

(ට) ආයතනයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය යන දෙපාර්ශ්වයේම වෘත්තිය සංවර්ධනයේ අභිවෘද්ධිය සඳහා විධිවිධාන සැලැස්වීම;

(ඩ) කාර්යය මණ්ඩලයේ සුබසාධන වැඩසටහන් සහ ආයතනික සමාජ වගකීම (සීඑස්ආර්) පිළිබඳ වැඩසටහන් සඳහා විධිවිධාන සැලැස්වීම සහ අනුග්‍රහය දැක්වීම;

(ණ) ආයතනයේ ආදි විද්‍යාර්ථීන්ගේ සංගමයේ සහ එහි සාමාජිකයන්ගේ අන්‍යෝන්‍ය ප්‍රතිලාභය සහ දියුණුව සඳහා ආදි විද්‍යාර්ථීන්ගේ සංගමය විසින් පිහිටුවන ලද යම් සංවිධානයක කටයුතු සඳහා සහයෝගය ලබා දීම, අනුග්‍රහය ලබා දීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ත) අසාත්මිකතාවේද සහ ප්‍රතිශක්තිවේද විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධයෙන් සෞඛ්‍ය සේවා කාර්යය මණ්ඩලය පුහුණු කිරීම සඳහා එකී විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ පුහුණු මධ්‍යස්ථානයක් පිහිටුවීම;

(ද) ආයතනයේ පර්යේෂණ ක්‍රමෝපාය සහ ප්‍රමුඛතා පැහැදිලි කිරීම පිළිබඳ වගකීම දරන පර්යේෂණ අංශයක් පිහිටුවීම;

(න) කළමනාකරණ මණ්ඩලයේ නිර්දේශය මත සහ පාලක සභාවේ අනුමතය ඇතිව විදේශීය ප්‍රදාන හෝ ආධාර සම්බන්ධයෙන් ගිවිසුම්වලට ඇතුළත් වීම;

(ප) අසාත්මිකතාවේදය, ප්‍රතිශක්තිවේදය. අණුක වෛද්‍ය විද්‍යාව සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා පැවැත්වීම සහ පුහුණු කිරීම්, පර්යේෂණ සහ ප්‍රකාශන සිදු කිරීම සඳහා අධ්‍යයන සහ අනධ්‍යන කාර්යය මණ්ඩල උපාංග සහ වෙනත් ආකාරවල සම්පත් හුවමාරු කර ගැනීම, බෙදා ගැනීම හෝ ලබා ගැනීම මාර්ගයෙන් ආයතනයේ බලතල කාර්යය සහ කර්තව්‍යවලට සමාන බලතල, කාර්යය සහ කර්තව්‍ය තිබෙන ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි විශ්වවිද්‍යාල සහ ආයතන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(බ) අවස්ථා හෝ සම්පත් සැපයීම මගින් හෝ අන්‍යාකාරයෙන් ආයතනයේ ඉගැන්වීම්, පුහුණු කිරීම සහ පර්යේෂණ විභවතාව වර්ධනය කිරීමේ කාර්යය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි රාජ්‍ය අංශයේ හෝ පෞද්ගලික අංශයේ ආයතන සහ සංවිධාන සමග සහයෝගයෙන් කටයුතු කිරීම;

(ම) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි ගාස්තු අය කර ගැනීම සහ එවැනි මුදල් සහ උපකරණ භාර ගැනීම සහ බෙදා දීම; සහ

(ය) ආයතනයේ බලතල ක්‍රියාත්මක කිරීම සහ ආයතනයේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා ප්‍රයෝජනවත් හෝ ආනුෂංගික හෝ අවශ්‍ය වෙනත් සියලු ක්‍රියා හෝ කිරීම.

## II වන කොටස

### ආයතනයේ අධ්‍යක්ෂවරයා සහ වෙනත් නිලධරයන්

5. අධ්‍යක්ෂවරයා සහ මේ නියමාවලියේ නිලධරයකු ලෙස නිශ්චිතව දක්වා ඇති වෙනත් යම් තනතුරක් දරන්නකු මේ නියමාවලියේ කාර්යය සඳහා ආයතනයේ නිලධරයන් විය යුතු ය.

6. (1) ආයතනයේ ප්‍රථම අධ්‍යක්ෂවරයා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) ඉන්පසු සෑම අධ්‍යක්ෂවරයකුම, කොමිෂන් සභාවේ එකඟතාවය මත, පාලක සභාව විසින්, 10 වන ඡේදයේ සඳහන් ආයතනයේ කළමනාකරණ මණ්ඩලය විසින් නම් කරනු ලබන තැනැත්තන් තිදෙනකුගේ මූල මණ්ඩලයකින් පත් කරනු ලැබිය යුතු ය.

එසේ වුව ද, කිසිම තැනැත්තකු අනුගාමී ධුර කාල දෙකකට වඩා අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(3) උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු ලැබූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, එම ආයතනය හෝ විද්‍යායතනය විසින්, එසේ පත් කරන ලද එකී කාර්යය මණ්ඩල සාමාජිකයාට ආයතනයේ අධ්‍යක්ෂ ධුරය භාර ගැනීමට හැකි කරවීම සඳහා ඔහු මුදාහරිනු ලැබිය යුතු ය.

(4) අධ්‍යක්ෂවරයා, කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් හෝ (5) වන අනුඡේදය යටතේ ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට වසර තුනක කාලසීමාවක් ගතවීම හෝ ඔහු විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ වීම යන දිනයන්ගෙන් කලින් එළඹෙන දිනය තෙක් ධුරය දරනු ලැබිය යුතු ය.

(5) පාලක සභාවේ නිර්දේශය මත. කොමිෂන් සභාව විසින්, දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ කලමනාකරණ මණ්ඩලයේ විශේෂ රැස්වීමක දී එම මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කරගනු ලබන දෝෂාරෝපණ යෝජනාවක් මත අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය. එම විශේෂ රැස්වීමට පැමිණි සාමාජිකයන් විසින්, ඔවුන් අතරින්, අධ්‍යක්ෂවරයා නොවන වෙනත් යම් තැනැත්තකු එම විශේෂ රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතුය.

(6) අධ්‍යක්ෂවරයා පාලක සභාවේ විනය පාලනයට යටත් විය යුතු ය.

(7) ධුරයෙන් ඉල්ලා අස්වූ හෝ ධුරයෙන් ඉවත් කරන ලද හෝ තම ධුර කාලය සම්පූර්ණ කරන ලද අධ්‍යක්ෂවරයා, ඔහු අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබීමට පෙරාතුවම උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්යය මණ්ඩලයේ සාමාජිකයකුව සිටියේ නම් සහ තම විශ්‍රාම ගැනීමේ වයස සම්පූර්ණ කර නොමැති නම්, අවස්ථාවෝචිත පරිදි, එම උසස් අධ්‍යාපන ආයතනයේ හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට පෙරළා පැමිණිය හැකි ය.

(8) අධ්‍යක්ෂවරයා නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා ඔහුට ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එසේ කාර්යය ඉටු කිරීමට නොහැකිවීමෙන් දින හතක් ඇතුළත, අධ්‍යක්ෂවරයාගේ කාර්යය ඉටු කිරීම සඳහා වෙනත් යම් සුදුසු තැනැත්තකු පත් කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන වැඩපිළිවෙළක් යෙදිය යුතු අතර, එසේ වැඩපිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් අධ්‍යක්ෂවරයාගේ කාර්යය ඉටු කරනු ලැබිය යුතු ය.

(9) අධ්‍යක්ෂවරයාගේ ධුරයේ යම් පුරප්පාඩුවක් ඇති වූ අවස්ථාවක, කොමිෂන් සභාව විසින්, එම පුරප්පාඩුව ඇතිවීමෙන් දින හතක් ඇතුළත, 6(2) වන ඡේදය යටතේ ස්ථිර පත් කිරීමක් සිදු කරනු ලබන තෙක් එකී අධ්‍යක්ෂවරයාගේ ධුරයේ කාර්යය ඉටු කිරීම සඳහා කොමිෂන් සභාව විසින් සුදුසු යයි සලකනු ලබන වැඩපිළිවෙළක් යෙදිය යුතු අතර, එසේ වැඩපිළවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා විසින් අධයක්ෂවරයාගේ ධුරයේ කාර්යය ඉටු කරනු ලැබිය යුතු ය.

7. අධ්‍යක්ෂවරයා :-

(අ) ආයතනයේ පූර්ණ කාලීන නිලධරයකු විය යුතු ය;

(ආ) ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා, ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා සහ ගණන් තැබීමේ නිලධරයා විය යුතු ය;

(ඇ) ආයතනයේ කළමනාකරණ මණ්ඩලයේ සහ ශාස්ත්‍රීය කමිටුවේ නිල බලයෙන් පත්වන සාමාජිකයකු සහ සභාපතිවරයා සහ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ, එක් එක් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සහ එක් එක් ස්ථාවර කමිටුවේ නිලබලයෙන් පත්වන සාමාජිකයකු විය යුතු ය; සහ

(ඈ) ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ පුද්ගල මණ්ඩලයක යම් රැස්වීමක් කැඳවීමට, එම රැස්වීමට පැමිණ සිටීමට සහ එම රැස්වීමේ දී කථා කිරීමට අධ්‍යක්ෂවරයාට හිමිකම් ඇති නමුත් ඔහු එම බල මණ්ඩලයේ හෝ පුද්ගල මණ්ඩලයේ සාමාජිකයකු වන්නේ නම් මිස, එවැනි යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහු හිමිකම් නොලැබිය යුතු ය.

8. (1) (අ) තත්කාර්ය සඳහා සාදනු ලබන අතුරු ව්‍යවස්ථාවලට; සහ

(ආ) කලින් කල, කළමනාකරණ මණ්ඩලය, ශාස්ත්‍රීය කමිටුව, එක් එක් අධ්‍යයන මණ්ඩලය, එක් එක් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලය සහ එක් එක් ස්ථාවර කමිටුව විසින් තත්කාර්ය සඳහා තමා වෙත නීත්‍යානුකූලව නිකුත් කරනු ලබන යම් විධානවලට,

අනුකූලව, පනතේ සහ ඒ යටතේ සාදනු ලබන යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාළ වන තාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින්, ඒ කාර්යය සඳහා අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලැබිය හැකි සියලු බලතල ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(2) කළමනාකරණ මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ එක් එක් අධ්‍යයන මණ්ඩලයේ, එක් එක් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සහ එක් එක් ස්ථාවර කමිටුවේ තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීමට වග බලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(3) පාලක සභාව ඉදිරියෙහි පෙනී සිටින ලෙස තමාට ආරාධනා කළ විට එසේ පෙනී සිටීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය විය යුතු ය.

(4) ආයතනය තුළ විනය, පරිපාලනය සහ ශාස්ත්‍රීය ප්‍රශස්තතාව සහ ප්‍රමිතීන් පවත්වාගෙන යාම සඳහා අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

## III වන කොටස

### ආයතනයේ බල මණ්ඩල

9. ආයතනයේ බල මණ්ඩල පහත දැක්වෙන පරිදි විය යුතු ය :-

(අ) කළමනාකරණ මණ්ඩලය;

(ආ) ශාස්ත්‍රීය කමිටුව;

(ඇ) අධ්‍යයන මණ්ඩල; සහ

(ඈ) විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩල.

## IV වන කොටස

### කළමනාකරණ මණ්ඩලය

9. (1) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් තිබිය යුතු අතර, එය ආයතනයේ ශාස්ත්‍රීය සහ විධායක මණ්ඩලය විය යුතු ය.

(2) මණ්ඩලය -

(අ) පහත දැක්වෙන නිල බලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්, එනම් -

(i) අධ්‍යක්ෂවරයා;

(ii) අධ්‍යාපන විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(iii) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(iv) මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්වරයකුගේ නිලයට නොඅඩු නිලයක් දරන ඔහුගේ නාමිකයකු;

(v) සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා;

(vi) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා;

(vii) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා විසින් නම් කරනු ලබන එම පීඨයේ අසාත්මිකතාවේදය, ප්‍රතිශක්තිවේදය හෝ අණුක වෛද්‍ය විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයා; සහ

(viii) පෙරාතුව ම වූ ආයතනයේ අධ්‍යක්ෂවරයා (සිටී නම්); සහ

(ආ) පහත දැක්වෙන පත් කළ සහ තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයන්ගෙන්; එනම් -

(i) නීතිය, මූල්‍ය හෝ පරිපාලන ක්ෂේත්‍රයන්හි විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු;

(ii) (මෙහි මින් මතු "තෝරා පත් කරගනු ලැබූ සාමාජිකයා" යනුවෙන් සඳහන් කරනු ලබන) පාලක සභාවේ පත් කළ සාමාජිකයන් අතරින් පාලක සභාව විසින් තෝරා පත් කරගනු ලබන සාමාජිකයකු; සහ

(iii) පාලක සභාව විසින් පත් කරනු ලබන, ආයතනයේ ආචාර්යවරුන් දෙදෙනකුගෙන්,

සමන්විය යුතු ය.

(2) ඒ සඳහා අවශ්‍යතාවයක් උද්ගත වූ කවර හෝ අවස්ථාවක, මණ්ඩලය විසින්, අවශ්‍ය ක්ෂේත්‍රයේ ප්‍රත්‍යක්ෂ වූ දැනුම සතු යම් විශේෂඥවරයකු යම් නිශ්චිත කාර්යයක් සඳහා සහ මණ්ඩලයේ ධූර කාලය නොඉක්මවන යම් නිශ්චිතව දක්වා ඇති කාලසීමාවක් සඳහා කැඳවනු ලැබිය හැකි ය.

එසේ වුව ද, මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දිමට හෝ තෝරා පත් කර ගැනීම සඳහා ඉදිරිපත් වීමට එකී විශේෂඥවරයාට අයිතිවාසිකමක් නොමැත්තේ ය.

11. (1) අධ්‍යක්ෂවරයා මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන දැරිය යුතු ය. සභාපතිවරයාට එවැනි යම් රැස්වීමක මුලසුන දැරීමට නොහැකි වන අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින්, පැමිණ සිටින යම් සාමාජිකයකු එම රැස්වීමේ මුලසුන දැරීම සඳහා තෝරා පත් කරගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා හෝ යම් පත් කළ සාමාජිකයකු මිය යාම, ධූරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම හේතුවෙන් කලින් ධූරය හිස් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, ඔහු තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට වසර තුනක කාලසීමාවක් සඳහා ධූරය දරනු ලැබිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, අවස්ථාවෝචිත පරිදි, නැවත තෝරා පත් කර ගනු ලැබීමට හෝ නැවත පත් කරගනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

එසේ වුව ද, තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා හෝ යම් පත් කළ සාමාජිකයකු ස්වකීය ධූර කාලය ඉකුත් වීමට පෙරාතුව ස්වකීය ධූරය හිස් කරනු ලැබුවහොත්, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු ද, කලින් ධූරය හිස් කරනු ලැබුවහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධූර කාලයෙන් නොගෙවී ඉතිරිව පවතින කාලය සඳහා ධූරය දැරිය යුතු ය.

එසේම තවදුරටත්, තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා, මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගැනීම සඳහා ඔහු සුදුසුකම් ලැබුවේ යම් තරාතිරමක් හෝ සාමාජිකවත්වයක් ප්‍රකාරව ද, එය දරන තාක් කල් ධූරය දැරිය යුතු ය.

(3) මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා විසින්, තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු විසින්, තත්කාර්යය සඳහා කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ඕනෑම අවස්ථාවක දී ස්වකීය ධූරයෙන් ඉල්ලා අස්වනු හැකි ය.

(5) මණ්ඩලයේ තෝරා පත් කර ගනු ලැබූ සාමාජිකයා හෝ යම් පත් කළ සාමාජිකයකු තත්කාර්යය සඳහා අවසරය නොලබා මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ධූරය අත්හැරිය සේ සලකනු ලැබිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි කොමිෂන් සභාව හෝ පාලක සභාව විසින්, ඉන් ඇතිවන පුරප්පාඩුව පිරිවීම සඳහා සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ සාමාජිකයන්ට, මුදල් විෂයය පවරා ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හෝ දීමනා ගෙවනු ලැබිය යුතු ය.

(7) මණ්ඩලයේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය එහි මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(8) මණ්ඩලය, අවශ්‍ය වන කවර වූ හෝ අවස්ථාවක දී රැස්විය යුතු ය. එසේ වුව ද, එක් ලිත් වර්ෂයක් තුළ මණ්ඩලය වාර හයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

(9) සභාපතිවරයා විසින්, අවශ්‍ය යයි ඔහු විසින් සලකනු ලබන කවර වූ හෝ අවස්ථාවක හෝ මණ්ඩලයේ මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවක් විසින් ඉදිරිපත් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් තමා වෙත ලැබී සතියක් ඇතුළත හෝ මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

12\. (1) මේ නියමාවලියේ අනෙකුත් විධිවිධානවලට සහ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට යටත් ව, මණ්ඩලයට ආයතනයේ ඉගැන්වීම්, අධ්‍යාපනය, පුහුණු කිරීම්, පර්යේෂණ සංවර්ධනය සහ උපදේශනය විෂයයෙහි පාලනය සහ සාමාන්‍ය විධානය තිබිය යුතු ය.

(2). (1) වන අනුඡේදයෙන් මණ්ඩලය වෙත පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, මණ්ඩල විසින්, පහත දැක්වෙන බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු යː-

(අ) ආයතනයේ දේපළ දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) පනතේ සහ පනත යටතේ සාදනු ලබන යම් උචිත සාධනපත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට සම්බන්ධ සියලු කාරණා විධිමත් කිරීම සහ නිශ්චය කිරීම;

(ඇ) 26 වන ඡේදය යටතේ පිහිටුවනු ලබන අරමුදල පරිපාලනය කිරීම;

(ඈ) ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීම හෝ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය ගාස්තු අය කර ගැනීම සහ එවැනි මුදල් සහ උපකරණ භාර ගැනීම සහ බෙදා දීම;

(ඉ) කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව, ආයතනයට ලැබෙන ත්‍යාග රික්තවරණ, පරිත්‍යාග සහ ප්‍රදාන භාර ගැනීම සහ පිළිගැනීම;

එසේ වුව ද, මණ්ඩලය විසින්, ආයතනයට ලැබෙන සියලු විදේශීය ත්‍යාග, රික්තවරණ, පරිත්‍යාග සහ ප්‍රදාන සඳහා විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය ලබා ගත යුතු ය;

(ඊ) ආයතනයේ වාර්ෂික වාර්තාව සහ විගණනය කළ ගිණුම් ඒවා පාලක සභාවට සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(උ) පවත්නා වර්ෂය සහ එළඹෙන වර්ෂය සඳහා ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කොට එම ඇස්තමේන්තු පාලක සභාව සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඌ) අවස්ථාවෝචිත පරිදි, ශාස්ත්‍රීය කමිටුව, එක් එක් අධ්‍යයන මණ්ඩලය හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලය විමසා, අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සඳහා ප්‍රදානය කරනු ලැබිය යුතු පශ්චාත් උපාධි අභිඥානපත්‍ර, උසස් අභිඥානපත්‍ර, පශ්චාත් උපාධි සහතික, දර්ශනපති උපාධි (එම්ෆිල්), අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංරචකයන් ඇතුළත් ශාස්ත්‍රපති උපාධි, ආචාර්ය උපාධි (පීඑච්ඩී) හෝ මණ්ඩලයේ සහතිකය සහිත වෙනත් උපාධි (එම්ඩී), සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා සඳහා සුදුසුකම් ලැබීමට අපේක්ෂා කරන ශිෂ්‍යයන් විසින් හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා, ලබාගත යුතු පුහුණුව, සමත්විය යුතු විභාග සහ සපුරාලිය යුතු වෙනත් කොන්දේසි විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම;

(එ) ශාස්ත්‍රීය කමිටුව විමසා, එකී අධ්‍යයන පාඨමාලා සඳහා අවශ්‍ය විභාග සමත්ව සහ අවශ්‍ය වෙනත් කොන්දේසි සපුරා ඇති සුදුසුකම්ලත් ශිෂ්‍යයන්ට ප්‍රතිශක්තිවේදයේ සහ ජෛව ඉංජිනේරු විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සඳහා ප්‍රදානය කළ යුතු ප්‍රථම උපාධි සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා විශ්වවිද්‍යාලය වෙත නිර්දේශ කිරීම;

(ඒ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දී ඇති හෝ නියම කර ඇති යම් කාරණාවක් සඳහා අතුරු ව්‍යවස්ථා සාදා, සාදන ලද එකී අතුරු ව්‍යවස්ථා පාලක සභාවේ අනුමතය සහ පළ කිරීම සඳහා පාලක සභාව වෙත ඉදිරිපත් කිරීම;

එසේ වුව ද, මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ, අදාළ අධ්‍යයන මණ්ඩලවල හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසුව හැර, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධ කිසිදු අතුරු ව්‍යවස්ථාවක් සාදනු නොලැබිය යුතු ය;

(ඔ) අවස්ථාවෝචිත පරිදි, මණ්ඩලයේ, ශාස්ත්‍රීය කමිටුවේ, අදාළ අධ්‍යයන මණ්ඩලවල හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලා සහ විභාග සහ විශේෂඥවරුන් ලෙස තැනැත්තන් පිළිගැනීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා සාදනු ලැබ, සාදන ලද එකී අතුරු ව්‍යවස්ථා සනාතන සභාවේ අනුමතය සඳහා සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඕ) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය පරිශ්‍ර, ගොඩනැගිලි, ගෘහභාණ්ඩ, උපකරණ, තොරතුරු තාක්ෂණ පහසුකම්, රසායනාගාර, කියවීම් ද්‍රව්‍ය සහ වෙනත් පහසුකම් සැපයීම;

(ක) අදාළ අධ්‍යයන මණ්ඩලය විමසා, ආයතනයේ ආචාර්යවරුන්, පරීක්ෂකවරුන්, පුහුණුකරුවන්, නිලධරයන් සහ වෙනත් සේවා නියුක්තයන් ලෙස පිළිගත යුතු සුදුසුකම්ලත් තැනැත්තන් සනාතන සභාව වෙත නිර්දේශ කිරීම;

(ග) ආයතනයේ කාර්යය සඳහා අවශ්‍ය විය හැකි ජ්‍යෙෂ්ඨ මහාචාර්ය ධුර, මහාචාර්ය ධුර, ආශ්‍රිත මහාචාර්ය ධුර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධුර, කථිකාචාර්ය ධුර හෝ පරිපාලන තනතුරු ද ඇතුළු වෙනත් යම් තනතුරු ඇති කිරීම, අහෝසි කිරීම හෝ තාවකාලික අත්හිටුවීම සඳහා සනාතන සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ච) ආයතනයේ සේවයේ නියුක්ත තැනැත්තන් හෝ ශිෂ්‍යයන්ගේ සේවය හෝ ශිෂ්‍යභාවය තාවකාලිකව අත්හිටුවීම, ඔවුන් පහකිරීම හෝ ඔවුන් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගැනීම සම්බන්ධයෙන් පාලක සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම;

(ජ) ශාස්ත්‍රීය කමිටුවේ සහ අදාළ අධ්‍යයන මණ්ඩලයේ වාර්තා සලකා බැලීමෙන් පසු, පාලක සභාවේ අනුමතය ඇතිව -

(i) පවත්නා අධ්‍යයන මණ්ඩල ප්‍රතිසංවිධානය කිරීම සහ අලුත් අධ්‍යයන මණ්ඩල පිහිටුවීම සඳහා වන යෝජනා ක්‍රම;

(ii) අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සම්බන්ධ අධ්‍යයන පාඨමාලා අදාළ අධ්‍යයන මණ්ඩල වෙත පැවරීම; සහ

(iii) අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ උප විශේෂඥ ක්ෂේත්‍ර අදාළ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩල වෙත පැවරීම;

සම්බන්ධයෙන් කොමිෂන් සභාව වෙත නිර්දේශ ඉදිරිපත් කිරීම

(ට) මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි යම් ස්ථාවර කමිටු හෝ තත්කාර්යය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම, ඒවායේ නිර්ණය කරන ලද විෂය නියම කිරීම; එම කමිටුවල වාර්තා සලකා බැලීම සහ වෙනස් කිරීම් සහිතව හෝ රහිතව එම වාර්තා අනුමත කිරීම හෝ එම වාර්තා ප්‍රතික්ෂේප කිරීම;

(ඩ) ශාස්ත්‍රීය කමිටුව සහ අදාළ අධ්‍යයන මණ්ඩලය විමසා සහ පාලක සභාවේ සමගාමීත්වය ඇතිව, අධ්‍යයන පාඨමාලාවලට ශිෂ්‍යයන් ඇතුළත් කර ගැනීමේ උපමාන නිශ්චය කිරීම;

(ණ) නොයොදවා ඇති යම් ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥාපනතේ 20 වන වගන්තියේ විධිවිධාන යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ භාර මුදල් ආයෝජනය කිරීම නීත්‍යානුකූල වන්නා වූ යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව එවැනි ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලදී ගැනීම සඳහා එවැනි මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වියදම සඳහා වහා අවශ්‍ය නොවන යම් මුදල් ප්‍රමාණයක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන බැංකුවක ස්ථාවර තැන්පතුවක තැන්පත් කිරීම; සහ

(ත) මේ නියමාවලියෙන් හෝ පනත යටතේ සාදනු ලබන වෙනත් යම් උචිත සාධනපත්‍රයකින් විධිවිධාන සලස්වා ඇති පරිදි ආයතනයේ බලතලවල ප්‍රතිඵලයක් වන හෝ ඒ බලතලවලට ආනුෂංගික වන ආයතනයේ වෙනත් සියලු බලතල ක්‍රියාත්මක කිරීම.

(3) ශාස්ත්‍රීය කාරණයක් හා සම්බන්ධ කිසිදු යෝජනාවක්, ඒ පිළිබඳව ස්වකීය මතය වාර්තාගත කර මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට ශාස්ත්‍රීය කමිටුවට සහ අදාළ අධ්‍යයන මණ්ඩලයට අවස්ථාවක් දී ඇත්නම් මිස, මණ්ඩලය විසින් සම්මත කරනු නොලැබිය යුතු ය.

එසේ වුව ද, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, එසේ සම්මත කරන ලද කිසිම යෝජනාවක් මත ක්‍රියා නොකළ යුතු ය.

(4) මේ ඡේදයේ, "ශාස්ත්‍රීය කාරණය" යන්නෙන්, ශාස්ත්‍රීය කමිටුවේ සහ අදාළ අධ්‍යයන මණ්ඩලයේ හෝ විශේෂඥ ක්ෂේත්‍ර මණ්ඩලයේ පාලනයට සහ සාමාන්‍ය විධානයට යටත් යම් කාරණයක් අදහස් වේ.

## V වන කොටස

## ශාස්ත්‍රීය කමිටුව

13. (1) (මේ නියමාවලියේ "ශාස්ත්‍රීය කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ ශාස්ත්‍රීය කමිටුවක් තිබිය යුතු අතර එය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශයේ ප්‍රධානියා;

(ඇ) එක් එක් අධ්‍යයන මණ්ඩලයේ නාමිකයකු;

(ඈ) ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් තෝරාපත් කරගනු ලබන්නා වූ. විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ පීඨ මණ්ඩලයේ නාමිකයකු;

(ඉ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහ ආශ්‍රිත මහාචාර්යවරයන්;

(ඊ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යාපීඨයේ, ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යන අංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයන්, සහ ආශ්‍රිත මහාචාර්යවරයන්

(උ) (1) (ඉ) අනුඡේදයේ සඳහන් සාමාජිකයන් නොවන, ආයතනයේ ස්ථිර ආචාර්යවරුන් අතරින් තෝරාපත් කර ගනු ලබන සාමාජිකයන් දෙදෙනකු; සහ

(ඌ) අදාළ ක්ෂේත්‍ර නියෝජනය කිරීම සඳහා, මණ්ඩලයේ නිර්දේශය මත විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් දෙදෙනකු.

(2) ශාස්ත්‍රීය කමිටුව විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, එකී ශාස්ත්‍රීය කමිටුව විසින් නිශ්චය කරනු ලබන යම් නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාලසීමාවක් සඳහා විශේෂඥවරයන්ට ආරාධනා කරනු ලැබිය හැකිය;

එසේ වුව ද, එසේ ආරාධනා කරන ලද විශේෂඥවරයාට ශාස්ත්‍රීය කමිටුවේ යම් රැස්වීමකදී ඡන්දය දීමට හෝ ඡන්දය සඳහා ඉදිරිපත්වීමට අයිතිවාසිකමක් නොතිබිය යුතු ය.

(3) ශාස්ත්‍රීය කමිටුවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය එහි මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් දෙකක් විය යුතුය.

(4) ශාස්ත්‍රීය කමිටුව අවශ්‍ය කවර වූ හෝ අවස්ථාවක රැස් විය හැකි ය.

එසේ වුවද, ශාස්ත්‍රීය කමිටුව එක් වර්ෂයක් තුළ හය වතාවකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

14. (1) මේ නියමාවලියේ සහ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ අධ්‍යාපනය, පුහුණු කිරීම්, පර්යේෂණ සහ විභාග සම්බන්ධයෙන් වන පාලනය සහ සාමාන්‍ය විධානය ශාස්ත්‍රීය කමිටුව සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදය මගින් ශාස්ත්‍රීය කමිටුව වෙත පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව -

(අ) මණ්ඩලය විසින් ශාස්ත්‍රීය කමිටුව වෙත යොමු කරන ලද යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කිරීම;

(ආ) අධ්‍යයන පාඨමාලා, ඉගැන්වීමේ වැඩසටහන්, පුහුණු කිරීමේ වැඩසටහන්, පර්යේෂණ වැඩසටහන් හෝ විභාග සම්බන්ධ කාරණා නොවන කාරණා සම්බන්ධව මණ්ඩලය වෙත නිර්දේශ සහ වාර්තා ඉදිරිපත් කිරීම;

(ඇ) සෑම මාස හයකට වරක්ම ආයතනයේ පර්යේෂණවල ප්‍රගතිය තක්සේරු කරනු ලැබිය යුතු ශාස්ත්‍රීය කමිටුව විසින් නම් කරන ලද සහ පාලක සභාව විසින් අනුමත කරන ලද ජාත්‍යන්තර මට්ටමේ කීර්තිමත් විද්‍යාඥයන් හයදෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත විද්‍යාත්මක උපදේශන කමිටුවක් පත් කිරීම;

(ඈ) යම් විශේෂ විෂයයක් පිළිබඳ සලකා බලා වාර්තා කිරීමේ කාර්යය සඳහා ශාස්ත්‍රීය කමිටුවේ සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි වෙනත් කමිටු පත්කිරීම;

(ඉ) (i) අධ්‍යයන පාඨමාලා සහ විභාග සඳහා ශිෂ්‍යයන් ඇතුළු කර ගැනීම සඳහා වන නියමයන්;

(ii) ආචාර්යවරයන් හෝ පරීක්ෂකවරයන් ලෙස පත් කිරීමට සුදුසු තැනැත්තන්;

(iii) නියමිත විභාග සමත්ව සහ අනෙකුත් නියමිත කොන්දේසි සපුරා උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ වෙනත් ශාස්ත්‍රීය සාමාර්ථ්‍යතා පිරිනැමීම සඳහා සුදුසුකම්ලත් තැනැත්තන්;

(iv) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග සඳහා තරග කෙරෙන ආකාරය සහ ඊට අදාළ කොන්දේසි; සහ

(v) අධි ශිෂ්‍යත්ව, ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර, ආධාර ශිෂ්‍යත්ව, පදක්කම් සහ වෙනත් ත්‍යාග පිරිනැමීම සඳහා සුදුසු තැනැත්තන්ගේ නම්,

මණ්ඩලය වෙත නිර්දේශ කිරීම; සහ

(ඊ) ආයතනයේ මතය අනුව ආයතනයේ ශාස්ත්‍රීය කාරණා ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය හෝ යෝග්‍ය හෝ ආනුෂංගික වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම,

සඳහා ශාස්ත්‍රීය කමිටුවට බලතල තිබිය යුතුය.

## VI වන කොටස

### අධ්‍යයන මණ්ඩල සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩල

15\. (1) පහත දැක්වෙන ක්ෂේත්‍ර සඳහා අධ්‍යයන මණ්ඩල පිහිටුවනු ලැබිය යුතුය :-

(අ) පර්යේෂණ සහ උසස් උපාධි;

(ආ) අභ්‍යන්තර ප්‍රථම උපාධි; සහ

(ඇ) අසාත්මිකතාවේදය සහ සායනික ප්‍රතිශක්තිවේදය පිළිබඳ විශාරද උපාධි (එම්ඩී).

(2) ආසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ උප විශේෂඥ ක්ෂේත්‍ර සඳහා විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩල පිහිටුවනු ලැබිය යුතු ය.

16. එක් එක් අධ්‍යයන මණ්ඩලයේ සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු ය.

17. පර්යේෂණ සහ උසස් උපාධි සඳහා වන අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානියා;

(ආ) ආයතනයේ එක් එක් අධ්‍යයන අංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ජ්‍යෝෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහ ආශ්‍රිත මහාචාර්යවරුන් ;

(ඇ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ජ්‍යෝෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන් සහ ආශ්‍රිත මහාචාර්යවරුන්;

(ඈ) ශ්‍රී ලංකාවේ වෙනත් විශ්වවිද්‍යාලවල ප්‍රතිශක්තිවේදය පිළිබඳ ආචාර්ය උපාධියක් සහිත සායනික වෛද්‍යවරුන් දෙදෙනකු; සහ

(ඉ) සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන ප්‍රතිශක්තිවේදී වෛද්‍යවරයකු.

18. (1) අභ්‍යන්තර උපාධි අපේක්ෂකයන්ගේ ප්‍රථම උපාධි සඳහා වන අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතුය :-

(අ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානියා;

(ආ) ආයතනයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ආචාර්යවරුන්;

(ඇ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ආචාර්යවරුන්;

(ඈ) ආයතනයේ ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටින වෛද්‍ය විද්‍යා පීඨයේ ආචාර්යවරුන් අතරින් ඒ පීඨයේ පීඨාධිපතිවරයා විසින් නම් කරනු ලබන ඒ පීඨයේ පීඨ මණ්ඩලයේ නියෝජිතයකු ;

(ඉ) උපාධි අපේක්ෂකයන්ගේ ප්‍රථම උපාධි ඉගැන්වීම් කටයුතුවල යෙදී සිටින ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ආචාර්යවරුන්; සහ

(ඊ) ආයතනය සමග ලියාපදිංචි වී ඇති අභ්‍යන්තර ප්‍රථම උපාධි අපේක්ෂක ශිෂ්‍යයන් අතරින් තෝරා පත් කරගනු ලබන ශිෂ්‍යයන් දෙදෙනකු.

(2) (1) (ඊ) අනුඡේදය යටතේ තෝරාපත් කර ගනු ලබන සාමාජිකයන් එසේ තෝරාපත් කර ගැනීමේ දින සිට එක් වසරක කාලසීමාවක් සඳහා එකී සාමාජිකයන් වශයෙන් ධුරය දැරිය යුතු අතර අනෙකුත් සාමාජිකයන් වසර තුනක කාලසීමාවක් සඳහා ධුරය දැරිය යුතු ය. තවද, ඔවුන් නැවත පත් කිරීම සඳහා සුදුස්සන් විය යුතු ය.

19. (1) වෛද්‍ය විශාරද උපාධි (එම්ඩී) වැඩසටහන් සඳහා වන අධ්‍යයන මණ්ඩලය පහත දැක්වෙන නිල බලයෙන් පත්වන සාමාජිකයන්ගෙන් සමන්විය යුතු යː-

(අ) සභාපතිවරයා විය යුතු අධ්‍යක්ෂවරයා;

(ආ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ප්‍රධානියා හෝ සම්බන්ධීකාරකවරයා;

(ඈ) විශ්වවිද්‍යාලයේ වෛද්‍ය විද්‍යා පීඨයේ ප්‍රතිශක්තිවේද සහ අණුක වෛද්‍ය විද්‍යා අධ්‍යයන අංශයේ ස්ථිර කාර්යය මණ්ඩලයේ සියලු ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් සහ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්;

(ඇ) ශ්‍රී ලංකා නිර්වින්දන සහ දැඩි සත්කාර වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඉ) ලංකා කායික වෛද්‍ය විශේෂඥයන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඊ) ශ්‍රී ලංකා ළමා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(උ) ශ්‍රී ලංකා උගුර, කන සහ නාසය පිළිබඳ විශේෂඥ වෛද්‍යවරුන්ගේ සහ හිස සහ ගෙල පිළිබඳ ශල්‍ය වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඌ) ශ්‍රී ලංකා හදිසි අවස්ථා වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(එ) ශ්‍රී ලංකා චර්ම රෝග සහ සංවේද්‍ය වෛද්‍ය විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඒ) ශ්‍රී ලංකා ළය රෝග වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ඔ) ලංකා පවුල් වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයෙකු;

(ඕ) ශ්‍රී ලංකා පිළිකා රෝග විශේෂඥ වෛද්‍යවරුන්ගේ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු;

(ක) ශ්‍රී ලංකා ක්ෂුද්‍ර ජීව විද්‍යාඥ විද්‍යායතනයේ සභාපතිවරයා හෝ ඔහුගේ නාමිකයකු.

20. විශේෂ කාර්යය සඳහා සහ ආසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ උප විශේෂඥ ක්ෂේත්‍රවල කාර්යය සඳහා, පාලක සභාව විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ප්‍රධානීන් හෝ වෙනත් විශේෂඥවරයන්, පුහුණුකරුවන්, ශාස්ත්‍රඥයන් සහ අධ්‍යයන මණ්ඩලයේ වෙනත් විශේෂඥවරයන් අතරින් පස්දෙනකුට නොඅඩු වූ ද දසදෙනකුට නොවැඩි වූ ද සාමාජිකයන් සංඛ්‍යාවක් එක් අවුරුද්දකට නොඅඩු වූද අවුරුදු තුනකට නොවැඩි වූ ද කාලසීමාවක් සඳහා පත් කරනු ලැබිය හැකි ය.

එසේ වුව ද, එසේ පත් කරන ලද කිසිම තැනැත්තකුට එම අධ්‍යයන මණ්ඩලයේ යම් රැස්වීමක දී ඡන්දය දීමේ හෝ ඡන්දය සඳහා ඉදිරිපත්වීමේ අයිතිවාසිකමක් නොතිබිය යුතු ය

එසේම තවදුරටත්, එකී සාමාජිකයා එකී නිශ්චිත ඉදිරිපත් කිරීමේ කාර්යය සඳහා යථා පරිදි පත් කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, එකී ඉදිරිපත් කිරීම සම්පූර්ණ කිරීමෙන් පසු ඔහු පත් කළ සාමාජිකයකු වීම අවසන් වන්නේ ය.

21. (1) අවස්ථාවෝචිත පරිදි, යම් අධ්‍යයන මණ්ඩලයක හෝ යම් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක යම් සාමාජිකයකු, ඔහු කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, ඔහු තෝරාපත් කර ගනු ලැබූ හෝ පත් කරනු ලැබූ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, නැවත තෝරා පත් කරගනු ලැබීම හෝ නැවත පත් කරගනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු යඃ

එසේ වුවද, යම් තෝරාපත් කරගනු ලැබූ හෝ පත් කළ සාමාජිකයකු ස්වකීය ධුර කාලය අවසන් වීමට පෙරාතුව ස්වකීය ධුරය හිස් කරනු ලැබූ අවස්ථාවක, ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, ඔහු ද කලින් ධුරය හිස් කරනු ලැබුවහොත් මිස, ඔහුගේ පූර්වගාමියාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව පවතින කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

එසේම තවදුරටත්, යම් අධ්‍යයන මණ්ඩලයක හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක සෑම තෝරා පත් කරගනු ලැබූ හෝ පත් කළ සාමාජිකයෙකු ම, අවස්ථාවෝචිත පරිදි, එම අධ්‍යයන මණ්ඩලයේ හෝ එම විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා පත් කර ගැනීම හෝ පත් කිරීම සඳහා ඔහු සුදුසුකම් ලැබුවේ යම් තරාතිරමක් හෝ සාමාජිකත්වයක් ප්‍රකාරව ද, එය දරන තාක් කල් ධුරය දැරිය යුතු අතර, එවැනි සාමාජිකයෙකු

වශයෙන් ඔහු එසේ තෝරාපත් කරගනු ලැබුයේ හෝ පත් කරනු ලැබූයේ, අවස්ථාවෝචිත පරිදි, යම් පුහුණු පාසලකින් ද, විශ්වවිද්‍යාලයකින් ද, අධ්‍යයන අංශයකින් ද නැතහොත් වෘත්තීය මණ්ඩලයකින් ද ඉන් ඉල්ලා අස්වීමේ දී, විශ්‍රාම ගැනීමේ දී හෝ මාරු කිරීමේ දී එකී සාමාජිකයා වීම අවසන් වන්නේ ය.

(2) යම් අධ්‍යයන මණ්ඩලයක හෝ යම් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක සාමාජිකයකුට, තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(3) යම් අධ්‍යයන මණ්ඩලයක හෝ යම් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක යම් තෝරාපත් කරගනු ලැබූ, පත්කළ හෝ නම්කළ සාමාජිකයෙකු අවසරය නොලබා, අවස්ථාවෝචිත පරිදි, එම අධ්‍යයන මණ්ඩලයේ හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීම පැහැර හැරියහොත්, ඔහු එම අධ්‍යයන මණ්ඩලයේ හෝ එම විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයෙකු වශයෙන් ධුරය අත්හැරිය සේ සලකනු ලැබිය යුතු අතර, අධ්‍යක්ෂවරයා විසින්, ඉන් ඇතිවන පුරප්පාඩුව පිරවීම සඳහා සුදුසු තැනැත්තෙකු පත් කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සංඛ්‍යාවකගේ ඡන්දයෙන් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත යම් අධ්‍යයන මණ්ඩලයක් හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක් විසුරුවා හැරීමේ හෝ යම් අධ්‍යයන මණ්ඩලයක හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක යම් සාමාජිකයකු ඉවත් කිරීමේ බලය මණ්ඩලය සතු විය යුතු ය.

22. (1) සෑම අධ්‍යයන මණ්ඩලයක ම සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක ම සභාපතිවරයකු සිටිය යුතු අතර, ඔහු අවස්ථාවෝචිත පරිදි, එම අධ්‍යයන මණ්ඩලයේ හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ සාමාජිකයන් විසින්, ඔවුන් අතරින් තෝරාපත් කරගනු ලැබිය යුතු ය.

(2) සෑම අධ්‍යයන මණ්ඩලයක ම සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක ම ලේකම්වරයකු සිටිය යුතු අතර, ඔහු එකී අධ්‍යයන මණ්ඩලයේ හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත මණ්ඩලය විසින් පත් කරගනු ලැබිය යුතු ය.

(3) යම් අධ්‍යයන මණ්ඩලයක හෝ යම් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක යම් රැස්වීමක් සඳහා ගණපූරණය, අදාළ මණ්ඩලයේ පත්කළ සාමාජිකයන් හැර, එහි මුළු සාමාජිකයන් සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(4) සෑම අධ්‍යයන මණ්ඩලයක් ම සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක් ම, අවශ්‍ය වන කවර වූ හෝ විටක දී රැස්විය යුතු ය. එසේ වුව ද, එක් වර්ෂයක් තුළ එකී මණ්ඩලය වාර දහයකට නොඅඩු වාර ගණනක් රැස්විය යුතු ය.

23. (1) මේ නියමාවලියේ සහ පනතේ සහ ඒ යටතේ සාදනු ලබන යම් උචිත සාධන පත්‍රයන විධිවිධානවලට යටත් ව, අදාළ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර සහ උප විශේෂඥ ක්ෂේත්‍ර සඳහා වන ඉගැන්වීම්, අධ්‍යාපනය, පර්යේෂණ, පුහුණු කිරීම් සහ විභාග සම්බන්ධයෙන් වන පාලනය සහ සාමාන්‍ය විධානය සෑම අධ්‍යයන මණ්ඩලයක් ම සහ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක් ම සතු විය යුතු ය.

(2) (1) වන අනුඡේදය මගින් එය වෙත පිරිනමන ලද බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, සෑම අධ්‍යයන මණ්ඩලයක් ම සහ සෑම විශේෂඥ අධ්‍යයන මණ්ඩලයක්ම විසින් පහත දැක්වෙන බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු යː-

(අ) මණ්ඩලය විසින් එවැනි යම් අධ්‍යයන මණ්ඩලයක් හෝ එවැනි යම් විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක් වෙත යොමු කරන ලද යම් කාරණයක් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කිරීම ;

(ආ) අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන්, විෂය නිර්දේශ සහ විභාග සම්බන්ධයෙන් වන සියලු කාරණා පිළිබඳ නිර්දේශ සහ වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඇ) අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් සාදන ලද අතුරු ව්‍යවස්ථා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඈ) යම් විශේෂ විෂයයක් සම්බන්ධයෙන් සලකා බලා ඒ පිළිබඳ වාර්තා කිරීමේ කාර්යය සඳහා, අදාළ වන විට දී, එවැනි යම් අදාළ අධ්‍යයන මණ්ඩලයක හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයක සාමාජිකයන් නොවන තැනැත්තන් ඇතුළත් විය හැකි අනුකමිටු පත් කරන ලෙස නිර්දේශ කිරීම;

(ඉ) ආයතනයේ පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා, පුහුණු වැඩසටහන් සහ විභාග සඳහා අභ්‍යාසලාභීන් ඇතුළත් කර ගැනීම සඳහා වන නියමයන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම; සහ

(ඊ) තත්කාර්යය සඳහා සාදන ලද අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව ආයතනයේ පුහුණුකරුවන් සහ පරීක්ෂකවරුන් ලෙස පිළිගැනීමට සුදුසු තැනැත්තන් මණ්ඩලය වෙත නිර්දේශ කිරීම.

## VII වන කොටස

### අධ්‍යයන අංශ

24. පහත දැක්වෙන අධ්‍යයන අංශ තිබිය යුතු ය. එනම් :-

(අ) අසාත්මිකතාවේද;

(ආ) ප්‍රතිශක්තිවේද; සහ

(ඇ) අණුක වෛද්‍ය විද්‍යාව සහ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාව.

25. (1) සෑම අධ්‍යයන අංශයක ම අයතනයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු, මහාචාර්යවරයකු, ආශ්‍රිත මහාචාර්යවරයකු හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු වන ප්‍රධානියකු සිටිය යුතු ය. ආයතනයේ එකී සෑම ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයකු ම, මහාචාර්යවරයකු ම, ආශ්‍රිත මහාචාර්යවරයකු ම හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයකු ම මණ්ඩලයේ නිර්දේශ මත පාලක සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) මේ නියමාවලියේ විධිවිධානවලට යටත්ව, අධ්‍යයන අංශ ප්‍රධානියා ඔහු පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වසර තුනක කාලසීමාවක් ධුරය දැරිය යුතු අතර, ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කරනු ලැබීම සඳහා සුදුස්සකු විය යුතු ය.

(3) සෑම අධ්‍යයන අංශ ප්‍රධානියකුටම මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික ලැබිය යුතු ය.

(4) නිවාඩු පිට සිටීම, රෝගාතුර වීම හෝ වෙනත් යම් හේතුවක් මත මාස තුනකට නොවැඩි කාලසීමාවකට ස්වකීය ධුරයේ කාර්යය ඉටුකිරීමට අධ්‍යයන අංශය ප්‍රධානියාට තාවකාලිකව නොහැකි වන අවස්ථාව, පාලක සභාව විසින්, එකී කාලසීමාව සඳහා අධ්‍යයන අංශ ප්‍රධානියාගේ තනතුරේ වැඩබැලීම සඳහා ආයතනයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරුන්, මහාචාර්යවරුන්, ආශ්‍රිත මහාචාර්යවරුන් හෝ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන් අතරින් යම් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය ;

එසේ වුව ද, අධ්‍යයන අංශ ප්‍රධානියකු විශ්‍රාම යනු ලබන හෝ ඉල්ලා අස්වන හෝ වෙනත් යම් හේතුවක් මත මාස තුනක් ඉක්මවන කාලසීමාවකට ස්වකීය ධුරයේ කාර්යය ඉටු කිරීමට ඔහුට නොහැකි වන අවස්ථාවක, එකී අධ්‍යයන අංශ ප්‍රධානියාගේ තනතුර හිස් වූ ලෙස සලකනු ලැබිය යුතු අතර, (1) වන අනුඡේදයේ විධිවිධානවලට අනුකූලව අලුත් අධ්‍යයන අංශ ප්‍රධානියකු පත් කරනු ලැබිය යුතු ය.

## VIII වන කොටස

### මුදල්

26. (1) ආයතනයට එහිම අරමුදලක් තිබිය යුතුය.

(2) අරමුදලට -

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) පරිත්‍යාගවලින්, ප්‍රදානවලින් සහ ත්‍යාගවලින් අත්වන ආදායම්;

(ඇ) කලින් කල පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබ ආයතනයේ කාර්යය සඳහා කොමිෂන් සභාව විසින් ප්‍රදාන වශයෙන් බෙදා දෙන සියලු මුදල්; සහ

(ඈ) කවර වූ හෝ ප්‍රභවයකින් ආයතනයට උපචිත වන වෙනත් සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) යම් මාසයක් තුළ දී අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් පිළිබඳ සාරාංශයක් අදාළ ආදායම් ශීර්ෂ යටතේ වර්ග කොට, ඊළඟට එළඹෙන මාසය අවසාන වීමට පෙර, අධ්‍යක්ෂවරයා විසින්, කොමිෂන් සභාවේ දැන ගැනීම සඳහා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

27. (1) (අ) පාලක සභාව විසින් නිශ්චය කරනු ලබන අකෘතියකට සහ ආකාරයකට ආයතනයේ ගිණුම් තැබීම;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාර ගැනීම සහ එම මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම; සහ

(ඈ) මණ්ඩලය වෙනුවෙන්, කොමිෂන් සභාව විසින් නියම කරනු ලබන ත්‍රෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඊළඟට එළඹෙන වර්ෂය සඳහා වාර්ෂික මූල්‍ය විසර්ජන පිළියෙල කිරීම,

අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ යඃ

එසේ වුව ද, නිශ්චිත කාර්යය සඳහා කරනු ලද ප්‍රදානවලින් හෝ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම ආයතනයේ ගිණුම්වල වෙන වෙනම ගිණුම්ගත කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්යය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරන ලද්දේ, පිළිවෙළින්, යම් කාර්යයක් හෝ අරමුණක් සඳහා ද, ඒවා නොවන යම් කාර්යයක් හෝ අරමුණක් සඳහා හෝ ඒ ආදායමෙන් කිසිදු ගෙවීමක් නොකළ යුතු ය.

28. ආයතනයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

29. (1) ආයතනය විසින්, එහි කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් ප්‍රකාශයක් සහ සංඛ්‍යාලේඛන, කොමිෂන් සභාව විසින් කලින් කල නිශ්චිතව දක්වනු ලැබිය හැකි ආකෘතියකට සහ ආකාරයකට සහ එසේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි විස්තර ද ඇතුළත්ව පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ තැබිය යුතු ය.

30. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළ පනතේ XIII වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ ගිණුම් විගණනය සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

## IX වන කොටස

### සාමාන්‍ය විධිවිධාන

31. (1) ආයතනයේ කාර්යය මණ්ඩලය, විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, ආයතනයේ බලතල, කාර්යය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි ආයතනය විසින් සලකනු ලැබිය හැකි යම් නිලධරයන්, ආචාර්යවරුන් සහ වෙනත් සේවානියුක්තයන් සංඛ්‍යාවකින් සමන්විත විය යුතු ය.

(2) ආයතනයේ කාර්යය මණ්ඩලය, අවස්ථාවෝචිත පරිදි, විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය අතරින් විශ්වවිද්‍යාලය විසින් මුදා හැරීමෙන් හෝ කොමිෂන් සභාව හෝ විශ්වවිද්‍යාලය විසින් ස්ථිරව පත් කිරීමෙන් සපයනු ලැබිය යුතු අතර, පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ආයතනයේ කාර්යය මණ්ඩලයට සිදු කරන ලද පත් කිරීම් සඳහා සහ ඒ සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාලීන පදනම මත මුදාහැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරෙහි ඔහු ලැබූ වැටුප සහ දීමනා ආයතනය විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය. අන්‍ය වූ අවස්ථාවක දී, ආයතනය විසින්, පාලක සභාව විමසා සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව එය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් දීමනාවක් එකී නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවා නියුක්තයාට ගෙවනු ලැබිය හැකි ය.

(4) ආයතනයේ කාර්යය මණ්ඩලය අධ්‍යක්ෂවරයාගේ විධානයට සහ විනය පාලනයට යටත් විය යුතු ය.

(5) ආයතනයේ කාර්යය මණ්ඩලය විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලයට අදාළ වන විනය රීතිවලට සහ කාර්යපටිපාටිවලට යටත් විය යුතු ය.

32. (1) යම් තැනැත්තකු, අවස්ථාවෝචිත පරිදි, ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් පුද්ගල මණ්ඩලයකට, අවස්ථාවෝචිත පරිදි, යථා පරිදි තෝරා පත් කරගෙන ඇත් ද, පත් කර ඇත් ද හෝ නම් කර ඇත් ද යන්න හෝ යම් තැනැත්තකු ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකයකු වීම සඳහා හිමිකම් ලබන්නේ ද යන්න සම්බන්ධයෙන් යම් ගැටලුවක් ඇති වූ අවස්ථාවක, එම ගැටලුව කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ සම්බන්ධයෙන් කොමිෂන් සභාව ලබා දෙන තීරණ අවසානාත්මක විය යුතු ය.

(2) ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් පුද්ගල මණ්ඩලයක සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුවෙන් පමණක් ඒ බල මණ්ඩලයේ හෝ වෙනත් පුද්ගල මණ්ඩලයේ කිසිදු ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ නඩු කටයුත්තක් බලරහිත නොවිය යුතු ය.

(3) මේ නියමාවලිය ක්‍රියාත්මකභාවයට එළඹීමෙන් පසු සහ මේ නියමාවලියේ, පනතේ සහ එය යටතේ සාදන ලද යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතනයේ නිර්දේශය මත අසාත්මිකතාවේදයේ, ප්‍රතිශක්තිවේදයේ සහ අණුක වෛද්‍ය විද්‍යාවේ ප්‍රධාන විශේෂඥ ක්ෂේත්‍ර පිළිබඳ ප්‍රථම උපාධි, පශ්චාත් උපාධි අභිඥානපත්‍ර, උසස් අභිඥානපත්‍ර, පශ්චාත් උපාධි සහතික, දර්ශනපති උපාධි (එම්ෆිල්), අධ්‍යයන ක්‍රියාකාරකම් සහ පර්යේෂණ සංරචකයක් ඇතුළත් ශාස්ත්‍රපති උපාධි, ආචාර්ය උපාධි (පීඑච්ඩී), මණ්ඩලයේ සහතිකය සහිත වෛද්‍ය විශාරද උපාධි (එම්.ඩී) සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමේ සහ පිරිනැමීමේ බලය විශ්වවිද්‍යාලය සතු වන්නේ ය.

## X වන කොටස

## අර්ථනිරූපණය

33. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ නියමාවලියේ -

"පනත" යන්නෙන්, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ;

"උචිත සාධනපත්‍රය" යන්නට, පනතින් ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"කොමිෂන් සභාව" යන්නෙන්, පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව අදහස් වේ;

"පාලක සභාව" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ පාලක සභාව අදහස් වේ;

"පරීක්ෂකවරයා" යන්නෙන්, දැනට පුහුණු පාසලක හෝ ආයතනයක පරීක්ෂකවරයකු හෝ සෞඛ්‍ය අමාත්‍යාංශයේ අදාළ විශේෂඥ ක්ෂේත්‍රයක ස්ථිර කාර්යය මණ්ඩලයේ සාමාජිකයකු හෝ පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල අදාළ පීඨවල අදාළ අධ්‍යයන අංශවල ශාස්ත්‍රඥයකු හෝ සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ අදාළ විශේෂඥවරයකු වන සහ පනත යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාලවල හෝ සෞඛ්‍ය විෂයය පවරා ඇති අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ හෝ මණ්ඩලය විසින් පිළිගත් යම් රජයේ ආයතනයක සක්‍රීය සේවයේ සිටිය යුතු වන තැනැත්තකු අදහස් වේ;

එසේ වුව ද, එකී සියලු පරීක්ෂකවරුන් සතුව වසර පහක ඉගැන්වීමේ සහ පුහුණු කිරීමේ පළපුරුද්දක් ද, අදාළ අධ්‍යයන මණ්ඩලයේ හෝ විශේෂඥ ක්ෂේත්‍ර අධ්‍යයන මණ්ඩලයේ නිර්දේශය මත මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි සහ සනාතන සභාව විසින් අනුමත කරනු ලබන පිළිගත් උපාධි ද තිබිය යුතු ය;

"උසස් අධ්‍යාපන ආයතනය" සහ "උසස් අධ්‍යාපන විද්‍යායතනය" යන්නට, පනතින් ඒවාට ලබා දී ඇති අර්ථයන් ම තිබිය යුතු ය;

"වෘත්තීය මණ්ඩලය" යන්නෙන්, පාර්ලිමේන්තු පනතක් මගින් සංස්ථාගත කරන ලද නැතහොත් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද, අසාත්මිකතාවේදය සහ ප්‍රතිශක්තිවේදය ඇතුළුව වෛද්‍ය විද්‍යාවේ යම් විශේෂඥ ක්ෂේත්‍රයක් සම්බන්ධයෙන් වන, වෘත්තීය සමිතියක් නොවන සංගමයක්, සමිතියක් හෝ වෙනත් යම් සංස්ථාපිත මණ්ඩලයක් හෝ වෙනත් යම් සංස්ථාපිත හෝ මණ්ඩලය විසින් පිළිගත්, සංස්ථාපිත නොවන වෘත්තීය මණ්ඩලයක් අදහස් වේ;

"සනාතන සභාව" යන්නෙන්, විශ්වවිද්‍යාලයේ සනාතන සභාව අදහස් වේ;

"ආචාර්යවරයා" යන්නට, පනතින් ඊට ලබා දී ඇති අර්ථය ම තිබිය යුතු ය; සහ

"විශ්වවිද්‍යාලය" යන්නෙන්, පනතේ විධිවිධාන යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය අදහස් වේ.

EOG 02 - 0191

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.